**මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2020**

**--------------------------------------------------**

## 1.1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්ව විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා රුහුණ වද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 10 වගන්තිය | විද්‍යායතනයේ 2016 වර්ෂයේ බඳවාගත් ශිෂ්‍ය කණ්ඩායමේ NVQ 6 වන මට්ටමේ II සමාසිකයේ පිළිතුරු පත් වක්‍රලේඛ නියමයන්ට පටහැනිව පරීක්ෂකවරයා භාරයේම තබාගෙන තිබුණි. | ලකුණු ලබාදීමේ පටිපාටිය අවසන් වූ වහාම පිළිතුරු පත් නිසි ලෙස ලබා දීම විද්‍යායතනයේ සාමාන්‍ය ක්‍රියාවලිය වන අතර නැවත ඒ බව සියලු අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත දැනුම් දීමට කටයුතු කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව සියලුම නිලධාරීන් කටයුතු කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල මෙහෙයුම් අත්පොතෙහි 4.7.3(ඒ)වගන්තිය | එක් එක් පාඨමාලාවල සිසුන් සඳහා දෛනිකව සිදු කරන දේශන හා ප්‍රායෝගික පුහුණු කිරීම සටහන් කිරීම සඳහා හා දේශන සිදුකිරීම අධීක්ෂණය කර වාර්තා කිරීම සඳහා ප්‍රගති වාර්තා පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | සියලුම පාඨමාලා වල ඉගැන්වීම් වාර්තා කිරීම ඉදිරි මාසයේ සිට විධිමත් කිරීමටත් කටයුතු කරමි. | මෙහෙයුම් අත්පොත අනුව ප්‍රගති වාර්තා පොත් පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු.6,411,532 ක් වටිනා පරිගණක මෘදුකාංග හා දෘඩාංගවලට අදාළව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2018 වර්ෂය සිට පවත්වාගෙන ආ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | චක්‍ර ලේඛ විධිවිධාන ප්‍රකාරව පරිගණක හා මෘදුකාංග පිළිබඳ වෙනම වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,488,772 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.825,352 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,663,420 ක වර්ධනයක් නිරීක්ෂණය විය.මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන රු.272,000,000කින් වැඩියෙන් ලැබී තිබීම හා මෙහෙයුම් වියදම් රු.2,426,131කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විද්‍යායතනය විසින් පවත්වාගෙන NVQ පාඨමාලාවන් සම්පූර්ණ කර වර්ෂ 03ක් තුළ එම සිසුන් සඳහා උසස් තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය නිකුත් කළ යුතු වුවද, 2016 වර්ෂයේ බඳවා ගෙන තිබූ ශිෂ්‍ය කණ්ඩායමට වර්ෂ 05ක් ගත වී තිබුණද පාඨමාලාව අවසන්කර සහතික පත්‍ර නිකුත් කර නොතිබුණි. | පසුගිය කාලය ඇතුලත විටින් විට සිදු වූ ශිෂ්‍ය විරෝධතා හේතුවෙන් දේශන වලට සහභාගී නොවීම, දීර්ඝකාලින පන්ති වර්ජන සහ ස්වභාවික ආපදා හේතුවෙන් ඔවුන්ගේ පාඨමාලා කාලය දීර්ඝ විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා ආරම්භ කර නියමිත පරිදි විභාග පවත්වා නියමිත කාලයේදී වෘතිකයකු බිහි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විද්‍යායතන මගින් පවත්වාගෙන යන එක් පාඨමාලාවක් සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍ය | මේ සඳහා ප්‍රතිපෝෂණ (feedback) ලබා ගැනීමේ ක්‍රමයක් සකසා පාඨමාලාව | පාඨමාලාවකට බඳවා ගත හැකි උපරිම ධාරිතාව පවත්වා ගනිමින් මානව හා භෞතික |

| | | | |
|---|---|---|---|
| | සංඛ්‍යාව 35 ට වඩා අඩුවෙන් බඳවාගෙන තිබුණි. එමෙන්ම ආරම්භයේදීම පාඨමාලා හැරයන්නන් හේතුවෙන් ඇතිවන පුරප්පාඩු පිරවීමට පැහැදිලි වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | හැරයාමට හේතුන් සොයා බලා සිසුන් පාඨමාලාව අවසන් වනතෙක් රඳවාගැනීමට වැඩසටහනක් සකස් කිරීමට කටයුතු කරමි. | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනිමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | විද්‍යායතනය මඟින් ක්‍රියාත්මක කරන පාඨමාලා 09ක් සඳහා 2017 හා 2018 ශිෂ්‍ය කණ්ඩායම් වෙනුවෙන් සැලසුම් කළ ප්‍රයෝගික ක්‍රියාකාරකම් පැය 10,090 කින් පැය 705 ක් පමණක් ඉටු කිරීම නිසා පාඨමාලා වලට අවශ්‍ය පැය ප්‍රමාණය ආවරණය වී නොතිබුණි. | විද්‍යාගාර පහසුකම් වල ඇති අඩුපාඩු සහ ඇතැම් පාඨමාලා සඳහා විද්‍යාගාර නොමැති නිසා ඒවා සම්පූර්ණ කිරීම සඳහා අධ්‍යයන චාරිකා මගින් සිදු කරනු ලැබේ. මෙහිදී අදාල පැය ප්‍රමානය සම්පූර්ණ නොවන අතර විෂය ආවරණ කිරීමක් කරනු ලැබේ. | ප්‍රායෝගිකගික ක්‍රියකාරකම් සහිත ගුණාත්මක වෘත්තිකයකු බිහි කිරිමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පාඨමාලා 09 ක් වෙනුවෙන් බඳවාගත් ශිෂ්‍ය කණ්ඩායම්වලින් 2015 ශිෂ්‍ය කණ්ඩායම පමණක් පාඨමාලාව අවසන්කර තිබුණු අතර, එම බඳවාගත් ශිෂ්‍ය කණ්ඩායමෙන් සිසුන් 80 ක් හෙවත් සියයට 67ක් පමණ පාඨමාලාව අඛණ්ඩව හදාරා තිබුණි. මෙම සිසුන් 80 දෙනාගෙන් 35 දෙනෙකු හෙවත් සියයට 44 ක් විභාග අසමත්වීම හේතුවෙන් පාඨමාලාව සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. | පාඨමාලාව අතරතුර පාඨමාලාව හැර යාමේදී, ඇතැම් සිසුන් නිත්‍යානුකූලව විද්‍යායතනයෙන් ඉවත් නොවීම නිසා පාඨමාලාව කර ගෙන ගිය ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි අගයක් ලෙස දක්වා ඇත. එය සමත් වූවන්ගේ ප්‍රතිශතය පහල අගයක් පෙන්වීමට බලපා ඇත. | අසාමාන්‍ය ලෙස විභාග අසමත් වීමට හේතුන් සොයා බලා ඒවාට පිළියම් යෙදීමට ක්‍රියා කල යුතුය. |
| (ආ) | 2017 හා 2018 ශිෂ්‍ය කණ්ඩායම් වෙනුවෙන් පවත්වන ලද පාඨමාලා 04 කා සමාසික දෙකෙහි විෂයයන් 58 ක අනුමත දේශන පැය ප්‍රමාණයෙන් පැය 2,555ක් ආවරණය කර නොතිබුණි. මෙම ප්‍රමාණය විෂයයන් සඳහා අනුමත දේශන පැය ප්‍රමාණයෙන් සියයට 30 කට වඩා වැඩි ප්‍රමාණයක් වී තිබුණි. | ශිෂ්‍ය උද්ඝෝෂණ / විරෝධතා හේතුවෙන් දේශණ සඳහා සහභාගී නොවීම, දීර්ඝකාලින පන්ති වර්ජන, ස්වභාවික ආපදා ආදිය නිසා විටින් විට ඉගැන්වීම් සඳහා බාධා ඇති විය. 2020 වර්ෂය තුල දී බොහෝ පාඨමාලා වල අධ්‍යයන කටයුතු මාර්ගගතව (Online) සිදු කෙරුණි. එහි දී දේශන පැය ගණන් සම්පූර්න කිරීමේ පැහැදිලි දුෂ්කරතාවයක් පැවතුනි. | අනුමත දේශන පැය ප්‍රමාණයන් ආවරණය කර සිසුන්ට න්‍යායාත්මක දැනුම ලබා දිමට ක්‍රියා කල යුතුය. |

**3.3** **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 2014 දෙසැම්බර් මාසයේ රු.1,250,000 ක් වැයකර මිල දී ගෙන තිබූ Wheel Alignment Gurage Aligner 680- EL උපකරණය 2021 මාර්තු 29 දින වන විටත් සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | අදාල උපකරණය සවිකිරීම සඳහා ප්‍රමාණවත් බිම් කොටසක් මෙම ආයතනයේ නොමැත. අප ආයතනයට විකල්ප ඉඩමක් ලැබුණු පසුව අදාල උපකරණ නිසි ප්‍රමිතියට අනුව සවිකිරීමට කටයුතු කරමි. | සිසුන්ගේ ප්‍රයෝගික ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නා උපකරණ උපරිම කාර්යක්ෂමව උපයෝජනයට ක්‍රියා කළ යුතුය |